# අභ්‍යන්තර සටහන

## ශික්ෂණ රෝහල - බදුල්ල

| | |
|---|---|
| දිනය | 2023.10. 06 |
| වෙත | 01. ප්‍ර. වෛද්‍ය නිලධාරී - බාහිර රෝගී අංශය<br>02. අනෙකුත් සියලුම වෛද්‍ය නිලධාරීන්<br>03. ප්‍ර.වි.ශ්‍රේ. හෙද නිලධාරී මගින් සියලුම වාට්ටු/ඒකක භාර හෙද නිලධාරීන් |
| වෙතින් | අධ්‍යක්ෂ |
| පිටපත් | 01. වි. අධිකරණ වෛද්‍ය නිලධාරී 02. වෛද්‍ය ලේඛණ සහකාර<br>03. රෝගීන් ලියාපදිංචි කිරීමේ අංශය 04. හදිසි මරණ පරීක්ෂක<br>05. ස්ථානාධිපති, රෝහල් පොලිසිය |
| විෂයය | ඇඳ ඉහපතෙහි සටහන් කර ඇති රෝගියාගේ නම සංශෝධනය කිරීම |
| යොමු අංකය | BD/GH/CPHMA/1/2013 |

රෝහලට ඇතුලත් කරන ලද රෝගීන්ගේ ඇඳ ඉහපතෙහි සටහන් කර ඇති නම නිවැරදි නොවන බැවින් එය නිවැරදි කර දීමට ඉදිරිපත් කරනු ලබන අවස්ථා බහුල වශයෙන් වාර්තා වේ.

ප්‍රායෝගික ගැටලු නොමැති අවස්ථා වල සෘජුවම බාහිර රෝගී අංශයට පැමිණ හා වෙනත් රෝහලකින් මාරුකර එවනු ලබන රෝගියෙකුගේ වුව ද නිවැරදි නම හැකිතාක් දුරට තහවුරු කර සටහන් කිරීම රෝගියා ඇතුලත් කරනු ලබන වෛද්‍ය නිලධාරීගේ වගකීමක් බව අවධාරණය කරමි. එමෙන්ම නම සටහන් කිරීමේදී නමෙහි කොටසක් පමණක් සටහන් නොකර සම්පූර්ණ නම සටහන් කිරීම මෙන්ම වයස, ස්ත්‍රී පුරුෂභාවය, ඇතුලත් කළ වේලාව පෙරවරු/පස්වරු ලෙස ඇතුලු තොරතුරු නිවැරදිව සටහන් කිරීම මගින් ගැටලු ඇති නොවීමට හැකි උපරිම උත්සහය දැරිය යුතුය. හැකි සෑම අවස්ථාවකම ජාතික හැඳුනුම්පතෙහි සඳහන් නමම සටහන් කළ යුතුය. රෝගියා වාට්ටුවට ඇතුලත් වීමට පැමිණෙන අවස්ථාවේදී ඇතුලත් කිරීම කරනු ලබන හෙද නිලධාරී විසින් ද නමෙහි නිරවද්‍යතාවය විමසිය යුතු අතර ඇතුලත් කිරීමේ ආකෘතියේ සටහන් කර ඇති නම නිවැරදි නොවේ නම් එය නැවත බාහිර රෝගී අංශයේ රෝගීන් ඇතුලත් කිරීමේ වෛද්‍යවරයා වෙත යොමු කර නම සංශෝධනය කර ගත යුතුය.

වාට්ටුවට ඇතුලත් කිරිමෙන් පසු රෝගීන් ඇතුලත් කිරීමේ ආකෘතියේ රෝගියාගේ නම සංශෝධනය කළ යුතු වන්නේ නම්,

i. රෝගියාගෙන් ඉල්ලීම් ලිපියක්

ii. රෝගියාගේ ජාතික හැඳුනුම්පත සමග එහි පිටපතක්

iii. රෝගියා ඉදිරිපත් කරනු ලබන විධිමත් දිවුරුම් ප්‍රකාශයක් (මෙ සමග අමුණා ඇති ආකෘතිය "A" පරිදි)

සමග අනුමැතිය සඳහා ඇඳ ඉහපතෙහි සටහනක් යොදා අධ්‍යක්ෂ කාර්යාලය වෙත එවිය යුතුවේ.

රෝගියාට අත්සන් කිරීමට නොහැකි අවස්ථාවක/මිය ගිය පසු නම සංශෝධනය කළ යුතු අවස්ථාවක පමණක්

i. රෝගියාගේ පවුලේ ළඟම ඥාතියෙකුගේ ඉල්ලීම් ලිපියක්

ii. ඉල්ලීම කරන අයගේ ජාතික හැඳුනුම්පත සමග එහි පිටපතක්

iii. ඉල්ලීම කරනු ලබන අයගෙන් විධිමත් දිවුරුම් ප්‍රකාශයක් (මේ සමග අමුණා ඇති ආකෘතිය "B" පරිදි)

iv. රෝගියාගේ ජාතික හැඳුනුම්පත සමග එහි පිටපතක්

ඉහත පරිදි සටහනක් යොදා ඉදිරිපත් කළ යුතුය.

එයට අනුමැතිය ලබා දුන් පසු බාහිර රෝගී අංශයේ ඇතුලත් කිරීමේ වෛද්‍ය නිලධාරී වෙතින් නම නිවැරදි කරවාගෙන රෝගීන් ලියාපදිංචි කිරීමේ අංශයට ඉදිරිපත් කර එහි සටහන් සංශෝධනය කර ගත යුතුය.

ඉන් පසු වාට්ටුවේ/ ඒකකයේ ලේඛන ද ඒ අනුව නිවැරදි කර ගත යුතු අතර රෝගියාගේ ජාතික හැඳුනම්පතෙහි පිටපත සහ අවශ්‍ය පරිදි ඉල්ලීම කරන අයගේ ජාතික හැඳුනුම්පතෙහි පිටපත සමග ඉහත සඳහන් අනෙකුත් ලේඛණ අදාල ඇඳ ඉහපතට අමුණා තැබිය යුතුය. රෝගී පරීක්ෂණ වාර්තා, ඖෂධ ලේඛණ වල නම සංශෝධනය කිරීම ප්‍රායෝගිකව අපහසු බැවින් ඇඳ ඉහපත් අංකය තිබේ නම් ඒවා සංශෝධනය අත්‍යවශ්‍යම නොවේ.

මෙම ක්‍රියාවලිය නිසි පරිදි සිදුව ඇතිදැයි තහවුරු කර ගැනීම අදාල කාර්ය භාර හෙද නිලධාරීගේ වගකීමකි.

Dr. Upul Karunarathne
MBBS, Msc (Med.Admin) MD(Med.Admin)
Director
Teaching Hospital, Badulla.